# සාධු නද මැද අගමැති දෙවැනි රන්වැට විවෘත කරයි

## අගමැති ශ්‍රී මහා බෝ සෙවනේදී කියයි

ජය ශ්‍රී මහා බෝධින්වහන්සේ අභියස දේවාල මළුවේ ඉදිකළ දෙවැනි රන්වැට ජාති, ආගම් පක්ෂ බේදයකින් තොරව මුළු මහත් ශ්‍රී ලංකාවම එකමුතු කළ ක්‍රියාවක් යැයි අගමැති රනිල් වික්‍රමසිංහ මහතා අනුරාධපුර ජයශ්‍රී මහා බෝධීන්වහන්සේගේ දෙවැනි රන් වැට නිරාවරණය කිරීමේ උළෙලේදී ප්‍රකාශ කෙළේය.

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අසල වූ මහා විහාරය, නිර්මල ථෙරවාදී බුදු දහම ආරක්ෂා කෙරුමට මහත් වූ සේවාවක් ඉටු කළ බවත්, මහා විහාරය පිහිටි ස්ථානය රුවන්වැලි සෑය අසලින් මේ වන විට සොයාගෙන ඇති බවත්, පුරා විද්‍යා කැණීම් මගින් ඒවා සංරක්ෂණය කර අනුරාධපුරයේ ශ්‍රී විභූතිය යළි නගා සිටුවීමට ආණ්ඩුව ක්‍රියා කරන බවත් අගමැති වික්‍රමසිංහ මහතා අවධාරණය කෙළේය.

මහා සංඝයාවහන්සේගේ හා බොදු උවසු උවැසියන්ගේ සහභාගිත්වයෙන් ඉකුත් 14 වැනිද ජයශ්‍රී මහා බෝධීන්වහන්සේ අභියස පැවැති මෙම උළෙල අමතා අගමැති රනිල් වික්‍රමසිංහ මහතා කළ කථාව මෙසේය.

"තථාගත බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමට සෙවන ලබා ගත් බුද්ධ ගයාවේ ජය ශ්‍රී මහා බෝධියේ දකුණු ශාඛාව ලංකාවේ රෝපණය කළා. ජය ශ්‍රී මහා බෝධියට ආරක්ෂාව සැපයීමට එම බෝධියේ දෙවැනි රන්වැට අප විවෘත කළා. වෙසක් පෝදිනයේ ජය ශ්‍රී මහ බෝ සෙවනේ බුදුන් වහන්සේ දේශනා කළා "ගෘහ නිර්මාණකය, මම ඔබ දුටුවෙමි. මින් පසු නුඹට එය නිර්මාණය කළ නොහැකිය" කියා.

එම වැකියෙන් ලොවෙහි විශාල විප්ලවයක් සිදුවුණා. දෙවිවරුන්, ගස් ගල්වලට ඇතුළුව අනෙක් පුද පූජාවන් වෙනුවට ආත්ම දමනය නමැති නිර්මාණකරුවා තමන්ගේ සිත තුළ ඉන්නවා කියා එදා තථාගතයන් වහන්සේ දේශනා කළා. එහෙනම් අපේ සිතිවිලි මෙල්ල කර මනස පාලනය කර චතුරාර්ය සත්‍යය මගින් මේ සසර මගින් මිදෙන්න පුළුවන් කියා බුදුරජාණන් වහන්සේ මාර්ගයක් පෙන්වා දුන්නා. එදාත් වලංගු එම ධර්මය 21 වැනි ශතවර්ෂයේ අදටත් වලංගුයි. එහෙම අවස්ථාවකදී බුදුන් වහන්සේ දේශනා කළ එම ධර්මය අද අපට එදාට වඩා සංකීර්ණ සමාජයක වඩා බලය තිබෙන සහ අදහස් ප්‍රකාශ කරන්න බලයක් තිබෙන තණ්හාවෙන් පිරුණු, ලෝකයකදී අපගේ සිතිවිලි පාලනය කරන්නේ නැතිනම්, අපේ මනස පාලනය කරන්නේ නැතිනම්, ඍජුව ක්‍රියා කරන්නේ නැත්නම් දැහැමි සමාජයක් බිහි කරන්නට බැහැ. එම දැහැමි සමාජය බිහිකිරීමත් පහසු කාර්යයක් නොවේ. එවන් අවස්ථාවක එම නිර්මල ධර්මය ලබා ගැනීමට සෙවන දුන් වෘක්ෂයට බුදුන් වහන්සේ පුද පූජා කළා. ඒ බෝධීන් වහන්සේගේ දකුණු ශාඛාවටයි අප මේ ශතවර්ෂ 22 – 23 ක් තිස්සේ පුද පූජා කෙළේ.

ජය ශ්‍රී මහා බෝධියට පුද පූජා පැවැත්වීමට ප්‍රධාන වශයෙන් හේතු කාරණා දෙකක් තිබුණා. දෙවන පැතිස් රජ සමයේ මිහිඳු මාහිමියන් වඩින විට මේ මහමෙවුනා උයනෙහි මහා විහාරය ඉදිකිරීමට අවස්ථාවතිබුණා. ජය ශ්‍රී මහා බෝධින්වහන්සේ ගේ දකුණු ශාඛාව රෝපණය කලේ එම මහා විහාරය අසලයි. ඉන් ශතවර්ෂ දෙකක් ගතවෙද්දී දුටුගැමුණු මහා රජතුමා විසින් රුවන්වැලි සෑය ඉදි කෙරුණා. ජය ශ්‍රී මහා බෝධියේ මුල් වෘක්ෂය ඉන්දියාවේ බුද්ධගයාවේදී නැතිවුවත් එහි දකුණු ශාඛාව අනුරාධපුරයේදී ආරක්ෂා වූවා. පුද පූජා ලැබුවා. ශතවර්ෂ ගණනාවක් චිරාත්ව පවතින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ විනාශ කිරීමට බොහෝ දෙනා උත්සාහ කළා. නමුත් එය සාර්ථක වුණේ නැහැ. එහෙම නම් බුදුන්වහන්සේ පිට දුන් ජය ශ්‍රී මහා බෝධියේ ජීවමාන බෝධි ශාඛාව ලෙස අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ පුද පූජා ලැබීම එක් කාරණාවක්.

ථෙරවාදී බුදු දහම මහා විහාරය හරහා ජය ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය මගින් ආරක්ෂා කෙරුණා. ඒ වගේම එම දහම යම් යම් තර්ජනවලට ලක්වුණා. ශතවර්ෂ හතක් අටක් පමණ එම තර්ජනවලට මුහුණ දුන්නා. මහා පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේදී මහා විහාරය පිළිගෙන යළි සසුන ආරක්ෂා වුණා. එතනදී තවත් දෙයක් සිදුවුණා. සිංහල දීපයේ බුදු දහම නිසා සිංහලේ බුද්ධ ධර්මය කියා අග්නිදිග ආසියානු පොත්වල සඳහන් වෙන ආකාරයට ඉන්දියාවේ බුදු දහම නැතිවෙද්දී මහා විහාරයේ සුරැකුණු බුදු දහම වෙනත් රටවලට පැතිරුණා. භික්ෂූන්වහන්සේ යළිත් මහා විහාරයේ උපසම්පදාව ලබා ගත්තා. එහෙම නම් මහා විහාරය අසල වැඩ සිටින මෙම ජය ශ්‍රී මහා බෝධිය නිසා බුදු දහම ආරක්ෂා වුණා. අග්නිදිග ආසියාවට බුදුදහම පැතිරීමේ කේන්ද්‍රස්ථානය මෙයයි. මේ හේතු දෙක නිසා ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ බුදු දහමේ චිරස්ථිතිය සම්බන්ධව වැදගත් ස්ථානයක් උසුලනවා.

මෙම හේතුන් නිසා අපේ රටේ රජවරුන් ශ්‍රී මහා බෝධිය ආරක්ෂා කිරීමට බොහෝ පියවර ගත්තා. දේවානම් පියතිස්ස රජ තුමා අඩි 78 ක් දිග අඩි 21 ක් පළල අඩි 56 ක් උස ප්‍රාකාරයක් බැඳ ජය ශ්‍රී මහා බෝධිය ආරක්ෂා කළා. දුටුගැමුණු රජතුමා රන් කහවනු ලක්ෂයක් පූජා කර මෙම ශ්‍රී මහා බෝධිය ආරක්ෂා කිරීමට ගත් පියවර ගැන ඉතිහාසයේ සඳහන් වෙනවා. නිදහස් ලංකාවේ ප්‍රථම වරට වසර 06 ක් තිස්සේ මුදල් එකතු කර ඩී. එස්. සේනානායක අගමැතිතුමා රුපියල් දශ ලක්ෂයක් මුදල් වියදම් කර ජය ශ්‍රී මහා බෝධිය වටා රන් වැටක් ඉදිකළා. එම විවෘත කිරීමේ උත්සවයට එවකට විපක්ෂ නායිකාව සිටි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියත් සහභාගි වුණා. ඒ වගේම පසුගිය වසරේ ජනවාරි මාසයේදී අපේ අටමස්ථානාධිපති ස්වාමින්වහන්සේ ජය ශ්‍රී මහා බෝධියේ ආරක්ෂාව සඳහා දෙවැනි රන් වැටක අවශ්‍යතාව ගැන



අගමැති රනිල් වික්‍රමසිංහ මහතා, මෛත්‍රී වික්‍රමසිංහ මහත්මිය, විපක්ෂනායක මහින්ද රාජපක්ෂ මහතා රන්වැට නිරාවරණය කිරීමේ පුණ්‍යෝත්සවයට සහභාගී වෙමින්...

මට කීවා. රාජ්‍ය අනුග්‍රහය ඇතිව රාජ්‍ය අංශයේත්, පෞද්ගලික අංශයේත් සියළු දෙනාගේම දායකත්වය ඇතිව එය ඉදිකළ යුතු බව අප තීරණය කළා.

කුඩා දරුවාගේ පටන් පාසල් දරුවන්ගෙන් පුංචි රුපියලේ සිට ප්‍රධාන පෙලේ ව්‍යාපාරිකයන් දක්වා ආගම් බේද, ජාති බේද පක්ෂ බේදවලින් තොරව ආධාර ලැබුණා. යාපනයෙන් පවා ආධාර දුන්නා. එබැවින් ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ වටා දෙවැනි රන් වැට ඉදිකිරීම රට එකමුතු කළ ක්‍රියාවක්.

මෙතැනින් අප නතරවන්නේ නැහැ. මහමෙව්නා උයන, අටමස්ථාන සංරක්ෂණය කරන්න පියවර ගෙන තිබෙනවා. දැනටම මහා විහාරය තිබුණ තැන සොයාගෙන කැනීම් කටයුතු රුවන්වැලි සෑය අබියස සිදු කරනවා. මෙම වැඩ කටයුතු සඳහා ආණ්ඩුව, පළාත් සභාවත් එකතුව වැඩ කළ යුතුයි. එසේ කටයුතු කළ හොත් අනුරාධපුරය නැවත ලෝකයේ බෞද්ධයින්ට පමණක් නොව සැම දෙනාම වැඳ පුද ගන්න එන බෞද්ධ ස්ථානයක් බවට පත් කළ හැකියි.

**අටමස්ථානාධිපති පල්ලේගම සිරිනිවාස හිමි –** මෙම ඓතිහාසික අවස්ථාව නෙත තුටු කඳුළු රඳවන පින්බර අවස්ථාවකි. යුගයෙන් යුගය අපේ රට ජාතියේ හා සම්බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය පිණිස බොහෝ දේ සිදුවුණු බව අපගේ යටගියාව සඳහන් කරයි. අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ මෙහෙයවීමෙන් ජය ශ්‍රී මහා බෝධි රන්වැට අරමුදල ඉටු කල මෙම කාර්යය එම යටගියාවේ රන් හුයට ඇමිණීමට හැකිවීම අප සියළු දෙනා පිරූ පාරමිතාවකි.

**ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ රන්වැට ඉදිකිරීමේ අරමුදලේ සභාපති කේ. එච්. ජේ. විජේදාස මහතා –** බෞද්ධයින්ගේ මුදුන් මල්කඩක් සේ සලකන අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේට රන් වැටක් පූජා කිරීමට හේතු වූ කරුණු තුනක් තිබේ.

සිංහල බෞද්ධ ශිෂ්ඨාචාරයේ හදවත බඳු එහි චිර ජීවනය ආරක්ෂා කිරීම, බෝධි වන්දනාවට පැමිණෙන බැතිමතුන්ගේ බුද්ධාලම්භන ප්‍රීතිය ඇතිකිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව මෙය සංරක්ෂණය කර අනාගත පරපුරට දායාද කිරීම එම කරුණු තුනයි.

අප ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ නානාවිධ ප්‍රාතිහාර්ය පාන එමෙන්ම අපට සිතූ පැතූ සම්පත් දෙන කප්රුකකි. වැසි නැති කළ වැසි ලබා දෙයි. දරුවන් නැති කළ දරුවන් ලබා දෙයි. සියලු අපල උපද්‍රව දුරු කර දෙයි. අප රට ජාතිය සහ ආගම පර සතුරු ආක්‍රමණ සහ උපද්‍රව වලින් ආරක්ෂා කර දෙයි. ජීවමාන බුදු රජාණන්වහන්සේ ලෙස වැඳුම් පිදුම් ලබයි. කිරි අහරින් පිදුම් ලබයි. නානුමුර මංගල්‍යයෙන් ප්‍රාණවත් වෙයි. රාජ්‍ය ආභරණ පැළඳවීමෙන් උද්දාම වෙයි. අළුත් සහලින් පිදුම් ලබයි. එපමණක් නොව සියක් වතාවකට වැඩි වාර සංඛ්‍යාවක් දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන්ගේ කෲර හස්තයෙන් සහ ග්‍රහණයෙන් බේරී අදත් ජීවමානව වැඩ සිටියි. ජයශ්‍රී මහා බෝධීන්වහන්සේ ආරක්ෂා කරන කළු දේවතා බණ්ඩාර දෙවියන්ගේ ආනුභාවය සහ හාස්කම් පිළිබඳව ජනප්‍රවාදයන් ද ජනතා විශ්වාසයන් ද අසීමිතය.

මෙහිදී යුද හමුදාවේ සියලු නිලයන්හි සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල් විසින් එකතු කරන ලද රුපියල් ලක්ෂ 30 ක මුදලක් ජය ශ්‍රී මහා බෝධියේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යුද හමුදාපති ලයනල් බලගල්ල මහතා විසින් අටමස්ථානාධිපති පල්ලේගම සිරිනිවාස හිමියන්ට ප්‍රදානය කිරීම විශේෂ සිද්ධියක් විය.

මෙම උත්සවයට විදුලිබල හා බලශක්ති ඇමැති කරු ජයසූරිය, බුද්ධ ශාසන සහ අධිකරණ නීති ප්‍රතිසංස්කරණ ඇමැති වි. ජ. මු. ලොකුබණ්ඩාර යන මහත්වරු ඇතුළුව ආණ්ඩුකාරවරයා, මහ ඇමැතිවරයා මෙන්ම රජයේ මැති ඇමැතිවරු විශාල පිරිසක් සහභාගි වූහ.

**විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මහතා –** ශ්‍රී මහා බෝධින්වහන්සේ ලොව ඇති

පැරණිම වෘක්ෂයයයි. ලොව කිසිම වෘක්ෂයකට මෙවන් පුද පූජා ලබන්නට හැකියාව ඇති වූවා යැයි කියා මම සිතන්නේ නැහැ. උන්වහන්සේ අප රටට පැමිණි ද සිට අපට උදාර සංස්කෘතියක් උරුම වුණා. එම සංස්කෘතිය තුළින් අපගේ ශිෂ්ඨාචාරය දියුණු වූවා. අප රටේ ඉතිහාසයේ සිටම බිහිවූ රජවරුන්, මැති ඇමැතිවරුන් මෙන්ම මහජනතාව ශ්‍රී මහා බෝධීන්වහන්සේ රැක ගැනීමට කැප වූවා. දෙවැනි පැතිස් රජ යුගයේ සිට ආරම්භ වූ ජය ශ්‍රී මහා බෝධි පූජාව අද දක්වාම පවත්වනවා. එබැවින් අප රට ආරක්ෂාවට උන්වහන්සේගෙන් ලැබෙන්නේ විශාල රැකවරණයක්.

අප රටේ ඉතිහාසයේ ලියැවුණු ග්‍රන්ථ තුළ ද ශ්‍රී මහා බෝධින් වහන්සේ ගැන ලියැවී තිබෙනවා. උන්වහන්සේ රැක ගැනීම අපගේ යුතුකමකි. අප රටට උන්වහන්සේ ගේ පිහිටෙන් සිංහල, දෙමළ, මුස්ලිම්, ජනතාවට ගෞරවාන්විත අයුරින් ජීවත් වන්නට ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

**රන්වැට අරමුදලේ සභාපති කේ. එච්. ජේ. විජේදස මහතා –** අගමැති රනිල් වික්‍රමසිංහ මහතා මෙරට අගමැතිවරයා ලෙස පත්වීමෙන් අනතුරුව දුන් ප්‍රතිඥාවක් අනුව ජය ශ්‍රී මහා බෝධිය වටා දෙවැනි රන්වැට ඉදිකර පූජා කරනු ලැබුවා. ජය ශ්‍රී මහා බෝධිය මේ රටේ ජනතාවට සිතූ පැතූ දේ ලබාදෙන කප්රුකක් බඳුයි. දර මිටි පූජාවෙන්, නානු මංගල්‍යයෙන්, අලුත් සහල් පූජාවෙන් ශතවර්ෂ ගණනාවක් තිස්සේ මේ රටේ ජනතාවගේ පුද පූජා ලබන එකම වෘක්ෂය ජය ශ්‍රී මහා බෝධියයි. ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ අප රටට තිසි කලට වැසි ලබා දෙනවා. දරුවන් ලබා ගැනීමට අපේ මව්වරුන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ආරක්ෂා කරනවා. කළු දේවතා බණ්ඩාර දෙවියන්ට භාරහාර වෙනවා. මේ ආකාරයෙන් මේ රටේ ජනතාවගේ ජීවිතය සමඟ බොහෝ සමීපව වැඩසිටින ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ ආරක්ෂා කිරීම සඳහාත් ජීවමාන බුදු රජාණන් වහන්සේ බඳු වූත් ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේගේ චිරස්ථිතිය උදෙසාත් අප ඉදිරියටත් ක්‍රියා මාර්ග රැසක් ගැනීමට සැලසුම් කර තිබෙනවා.

මෙම උත්සව අවස්ථාවට විදුලි බල හා බල ශක්ති ඇමති කරු ජයසූරිය, බුද්ධ ශාසන හා අධිකරණ ප්‍රතිසංස්කරණ ඇමැති වි. ජ. මු. ලොකුබණ්ඩාර, උතුරු මැද පළාත් සභාවේ ආණ්ඩුකාර ජී. එම්. එස්. සමරවීර, මහ ඇමැති බර්ටි ප්‍රේමලාල් දිසානායක යන මහත්වරු ඇතුළු සම්භාවනීය අමුත්තන් විශාල පිරිසක් සහභාගි වූහ.